www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධයේ අන්තරායට සමාජවාදී විසඳුමක්

**A socialist answer to the danger of war in Sri Lanka**

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රධාන ලේකම්**
**විජේ ඩයස් විසිනි**
**2006 මාර්තු 11**

නව ජනාධිපතිවරයෙකු පත් වන සෑම විටෙක දී ම සියලු දේශපාලන හා සමාජ පාපයන් විසඳීමට භාර ගන්නා ''නව ප්‍රවිෂ්ටයක්'' පොරොන්දු වනු ලැබේ. එය මේ රටේ චාරිත්‍රයකි. මහින්ද රාජපක්ෂ යාන්තමින් දිනා ගත් නොවැම්බර් මැතිවරනයේ දීත්, ''මහින්ද චින්තනය'' නමැති ඔහුගේ මහා සැලැස්ම වහා ම ක්‍රියාවට නගන බවට පොරොන්දු විය. එහෙත්, ඔහුගේ පාලනයට දින 100ක් ගත වන විට රටේ තත්වය හැරී ඇත්තේ වඩාත් නරක අතට ය.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සිය මැතිවරන ප්‍රකාශනය තුල මෙසේ අනතුරු ඇඟවී ය. ''දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට හෝ රටේ දෙමල සුලුතරයට කිසිදු සහන සැලසීමකට විරුද්ධ, සිය අවශ්‍යතාවන් සිංහල අධිපතිවාදය පවත්වා ගැනීම සමග බැඳී ඇති, රාජ්‍ය නිලධරය, මිලිටරිය, බෞද්ධ බලාධිකාරය හා ව්‍යාපාරික ක්ෂේත්‍රය රාජපක්ෂට පිටුබලය සපයයි. ඔහු සන්ධානගතව ඇත්තේ, සුනාමි ආධාර පරිපාලනයේ ඒකාබද්ධ ව්‍යුහයක් සඳහා එල්ටීටීඊය සමග ඇති කර ගත් පීටොම්ස් ගිවිසුම අත හැර දමා, වර්තමාන සටන් විරාමය සංශෝධනය කර, මිලිටරිය ශක්තිමත් කිරීමට බල කර සිටින ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජාහෙඋ) වැනි සිංහල අන්තවාදීන් සමග ය. මෙම ප්‍රතිපත්තීන්හි තර්කනය යුද්ධය සඳහා මග හෙලි කිරීම යි.''

පසු ගිය මාස තුනහමාරේ සියලු වර්ධනයන් දෙස බලන විට, තව දුරටත් රහසක් නොවන්නේ, රට පුරා විසිරී සිටින වැඩ කරන ජනතාවන් මුහුන දෙන ප්‍රධාන හා දැවෙන ප්‍රශ්නය පිලිබඳ අපගේ අනාවැකිය මුලුමනින් ම සනාථ වී ඇති බව ය. රට යුද්ධයේ අද්දරට ගෙනැවිත් ඇත. අඩුවකට ඇත්තේ නිල වසයෙන් යුද්ධය ප්‍රකාශයට පත් නොකිරීම පමනකි.

ජනාධිපති රාජපක්ෂගේ මුල් දෙමස තුල දෙපාර්ශ්වය ම කල පැහැර ගෙන යාම් හා ඝාතනවල බියකරු ප්‍රතිඵලය වූයේ 200කට වැඩි මරන සංඛ්‍යාවකි. එනම් සාමාන්‍යය, දිනකට මරන තුනකට වැඩි ගනනකි. ආන්ඩුව හා එල්ටීටීඊය ජිනීවාහි දී සාකච්ඡාවන්ට එකඟ වූ පසු ගිය මාසය තුල මිලේච්ඡ සිදුවීම්වල සාපේක්ෂ අඩු වීමක් දක්නට ලැබුන ද, 2002 සටන් විරාමය ආරක්ෂා කරන බවට දෙපාර්ශ්වය ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීමත් සමග ම යලි යුද ආතතීන් නැගී ඒමට පටන් ගෙන ඇත.

හමුදාපති සමග එකට පෙල ගැසෙමින් සටන් විරාමය හෙලා දුටු ජවිපෙ හා ජාහෙඋ ජිනීවාහි ඒකාබද්ධ ප්‍රකාශනය ප්‍රශ්නයට බඳුන් කරමින් එය ව්‍යවස්ථා විරෝධී හා ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වෛරී භාවය පාවා දීමක් බව අවධාරනය කරයි. උතුරු හා නැගෙනහිර යුද කලාපය තුල ඝාතන රැල්ල දැනට මත් යලි ඇරඹී තිබේ.

මෙම නව වර්ධනයන් අහම්බයන් නො ව, පසු ගිය දශක දෙකේ දේශපාලන අර්බුදයේ ම අලුත් දිග හැරීම යි. පාලක පන්තිය යලිදු වතාවක් ඔප්පු කර ඇත්තේ, ජනගහනයෙන් ඉමහත් බහුතරයකගේ -- සිංහල, දෙමල හා මුස්ලිම්, හින්දු හා බෞද්ධ -- සාමය, යහපත් ජීවිතයක් හා මූලික ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් පිලිබඳ බලාපොරොත්තු ඉටු කල හැකි පරිදි, යුද්ධය අවසන් කිරීමට ඔවුන්ගේ ඇති ඓන්ද්‍රීය නොසමත්කම යි.

## අධිරාජ්‍යවාදී ''සාම ක්‍රියාවලිය''

නිමක් නැති භාතෘ භාරක ලේ වැගිරීම්වල අවසානයක් දැකීමට නොඉවසිලිමත්ව සිටින වැඩ කරන ජනතාව හමුවේ අන්තර්-සම්බන්ධිත වැදගත් කාරනා දෙකක් තිබේ.

පලමු වැන්න නම්, යුද්ධයට විසඳුමක් සොයා ගැනීම සඳහා ඊනියා ''ජාත්‍යන්තර ප්‍රජාව,'' හෝ වඩාත් නිවැරදිව කිව හොත් අධිරාජ්‍යවාදී බලවතුන්, මත විශ්වාසය තැබීමේ නිෂ්ඵල භාවය යි. සසපය යලි යලිත් පෙන්වා දී ඇති පරිදි, ජාත්‍යන්තරව පුම්බනු ලැබ ඇති හා සියලු ධනපති හා සුලු ධනපති නියෝජිතයන් විසින් හුවා දක්වනු ලබන ''සාම ක්‍රියාවලිය'' වනාහි කම්කරු පන්තිය අවමංගත කිරීමේ හා දේශපාලනිකව නිරායුධ කිරීමේ මාරාන්තික මිථ්‍යාවකි.

1970 ගනන් අවසානයේ දී ආර්ථික ප්‍රතිව්‍යුහකරන සඳහා බල කිරීම මගින් සිවිල් යුද්ධයේ කොන්දේසි නිර්මානය කිරීම පිලිබඳව මූලිකව ම වගකිව යුත්තේ මෙම ගෝලීය බලවතුන් ම ය. නිදහසින් පසු පැවති ජාතිකව පරිපාලනය කල ආර්ථිකය බිඳ විසිරවීම අරමුනු කොට ගත් මෙම වැඩ පිලිවෙල ක්‍රියාත්මක කිරීමට එරෙහිව කම්කරු පන්තියෙන් ප්‍රතිරෝධය එල්ල වීම නියත විය. කොලඹ පාලක පන්තිය මීට පෙර අවස්ථාවල දී කලාක් මෙන් ම මෙයට ද ප්‍රතිචාර දැක්වූයේ කම්කරුවන් මැඩීම හා බෙදීම සඳහා දෙමල විරෝධය උසි ගැන්වීමත් රාජ්‍ය යන්ත්‍රය ශක්තිමත් කිරීමත් මගිනි.

''ජාත්‍යන්තර ප්‍රජාව'' සම්බන්ධයෙන් ගත් කල, දිවයින නිදහස් වෙලඳ පොල ප්‍රතිසංස්කරනයේ ප්‍රමුඛ නියාමකයෙක් බවට පත් කිරීමේ සිය අරමුන, 1983 දී පුපුරා ගිය සිවිල් යුද්ධය මගින් සාක්ෂාත් කර ගැනුනි. දශක එකහමාරක පමන කාලයක් තිස්සේ, දසදහස් ගනන් මිය යද්දී, ප්‍රධාන බලවතුන් යුද්ධය ගැන පවත්වා ගත් නිහඬතාව වටහා ගත හැක්කේ එම පදනම මත පමනකි.

1990 ගනන්වල අවසාන අදියර තුල දී ''සාම ක්‍රියාවලිය'' වෙත සිදු වූ මාරුව, යුද්ධය මගින් මහජනතාව මතට පත් කෙරුනු විනාශය පිලිබඳ උත්සුක වීමකින් පැන නැගුනක් නො වේ. නිෂ්පාදනයේ ගෝලීය රටාවන් වඩාත් ප්‍රමුඛත්වයක් ගැනීමත් 1990 ගනන්වල ඉන්දියාව ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස ඉතා වැදගත් තැනක් ගැනීමත් සමග ලංකාවේ සිවිල් යුද්ධය, කලාපීය ස්ථාවරත්වයට තර්ජනයක් සේ ද එහෙයින් එය නිමා කල යුතු බව ද ආයෝජකයන්ට පෙනී ගියේ ය. එල්ටීටීඊය සමග බලය බෙදා ගැනීමේ ගිවිසුමකට පැමිනිය යුතු ය හා දිවයින විදේශ ආයෝජකයන් සඳහා ස්ථායී, ලාභ ශ්‍රම කඳවුරක් බවට පත් කල යුතු ය යනුවෙන් එල්ල වන ජාත්‍යන්තර බලපෑමට කොලඹ ආන්ඩු හසු විය.

අධිරාජ්‍යවාදීන්ගේ ''සාම ප්‍රයත්න'' ලංකාවේ, කාශ්මීරයේ, ඉන්දුනීසියාවේ අචේ ප්‍රාන්තයේ හෝ මැදපෙරදිග වුවත් එය හුදෙක් සාමය සඳහා වන්නේ නො වේ. ඒවා ප්‍රධාන බලවතුන් විසින් සිය කොල්ලකාරී සැලසුම් අනෙකුන් මත පැටවීම සඳහා යොදා ගන්නා එක් උපාය ක්‍රමයක් පමනි. අධිරාජ්‍යවාදයේ සැබෑ මුහුන නිරාවරනය වී ඇත්තේ, එක්සත් ජනපදය හා එහි මිතුරන් විසින් ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය නව විජිතයන් බවට පත් කර ගැනීම සඳහා ගෙන යන නග්න ආක්‍රමන මගිනි.

සාම උපායේ සිට යුද්ධය කරා පැනීම ඉතා කඩිනමින් සිදු විය හැකි ය. එල්ටීටීඊය සාම මේසය කරා දැක්කීමට වොෂින්ටනය දැරූ උත්සාහය මධ්‍යයේ දී එක්සත් ජනපද ලංකා තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ්, පසු ගිය ජනවාරියේ දී කල තියුනු තර්ජනයේ දී ඔහු ප්‍රකාශ කලේ, එල්ටීටීඊය යුද්ධයේ මාවත තෝරා ගන්නේ නම් ඔවුන්ට ''මුහන දීමට සිදු වන්නේ බලගතු හමුදාවකට'' යනුවෙනි. ඔහුගේ සඳහන, එක්සත් ජනපදය විසින් සන්නද්ධ කර පුහුනු කෙරුනු හමුදාව ගැන ය. එම වචන නිකුත් කරන්නේ, 2003 දී එක්සත් ජනපදය මෙහෙයවූ නීති විරෝධී යුද්ධයට පෙරාතුව ඉරාක තන්ත්‍රයට එරෙහි භාවිත කල වචනවලට සමාන ආක්‍රමනකාරී හඬකි.

ලංකාවේ සාමය මෙම මදාවිකාරයන් අත රඳවා, වැඩ කරන ජනතාවට පසෙකට වී බලා සිටිය නොහැකි ය. අව්‍යාජ සාමය, දිවයින පුරා වෙසෙන සියලු ජන කන්ඩායම්වල සමාජ සමානතාව හා ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් සඳහා අරගලය සමග නො වෙන් කල හැකි සේ බැඳී පවතියි. මෙම මූලික අරමුනු දිනා ගැනීමේ අරගලයේ දී වැඩ කරන ජනතාව ඉක්මනින් ම දැක ගනු ඇත්තේ තම ප්‍රධාන ම සතුරන් නම් වොෂින්ටනයේ, ටෝකියෝවේ හා යුරෝපා අග නගරයන්හි සිටින සාම ක්‍රියාවලියේ වත්මන් නියාමකයන් ම බව යි.

සසපය, කම්කරු ජනතාවට කියා සිටින්නේ, අධිරාජ්‍යවාදයට එරෙහි සටනේ දී ඊට සක්‍යතාව ඇති එක ම ප්‍රගතිශීලී සමාජ බලවේගය වන ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙත හැරෙන ලෙස යි. සාමය, ප්‍රජාතන්ත්‍රවාදය හා යහපත් ජීවන තත්වයන් සඳහා සටන් වදින ශ්‍රී ලාංකික කම්කරුවන්ගේ ඉල්ලීමක්, එය පැන නැගෙන්නේ කුඩා හා ඓතිහාසිකව පසුගාමී රටකින් වුවත්, අධිරාජ්‍යවාදී ආක්‍රමනකාරීත්වයට හා ගෝලීය ධනවාදයෙහි පරාගතික ආර්ථික පිලිවෙත්වල බලපෑම කෙරෙහි වෛරී සහගතව පෘථිවි ගෝලය පුරා විසිරී සිටින දශලක්ෂ සංඛ්‍යාත වැඩ කරන ජනතාවන්ගේ මහා අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයකට බලගතු උත්ප්‍රේරකයක් වනු ඇත.

## කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය

කම්කරුවන් මුහුන පාන දෙවන වැදගත් කාරනය වන්නේ, සිය පන්ති සතුරාගේ නො ව, තමන්ගේ ඓතිහාසික අවශ්‍යතාවන් වෙනුවෙන් පෙනී සිටින ස්වාධීන නායකත්වයක හා දේශපාලන ක්‍රියා මාර්ගයක අවශ්‍යතාව යි.

යුද්ධයට තුඩු දුන් යථා ප්‍රශ්නවලට සැබෑ විසඳුමක් ලබා දීමේ පදනම මත සාම ගිවිසුමකට එලඹීමෙහි ලා, සියලු ම කොලඹ ආන්ඩු -- ඔවුන්ගේ පැහැය කුමක් වුවත් -- පෙන්වා ඇති අසමත්කම මතු වන්නේ, ශ්‍රී ලංකා ධනේශ්වරයේ සියලු කොටස් විසින් ක්‍රියාවට නැගුනු වාර්ගික දේශපාලනයෙන් ම ය. මූලාරම්භයේ පටන් ම, කම්කරුවන්ගේ ව්‍යාපාරයක් හා ගොවි ජනතාව තමන් වෙත ඇද ගැනීමෙහි ලා එය සතු ධාරිතාව ගැන බියට පත් පාලක පන්තීන්, එය කපා හැරීමට පාවිච්චි කලේ වර්ගවාදයේ තුරුම්පුව යි. 1947-

48න් පසුව, දකුනු ආසියාවේ ''නිදහස'' ලබා ගත් සියලු ධනේශ්වර පක්ෂවලට මග පෙන්වූ මූලධර්මය බවට පත්ව ඇත්තේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයෙහි මුඛ්‍ය ආදර්ශ පාඨයක් වූ ''බෙදා වෙන් කොට පාලනය කිරීම'' යි. ඉන්දියාවේ හා පකිස්ථානයේ දී පාලක පැලැන්තිය උපමහාද්වීපය බෙදීමටත් එය හා බැඳුනු ලේ ගංගාවටත් සහාය දුනි. ලංකාවේ දී, වාර්ගික පදනමෙන් පුරවැසි භාවය තීරනය කරමින්, 1948 දී, දශලක්ෂයකට අධික දෙමල කතා කරන වතු කම්කරුවන්ට සිය අයිතිය අහිමි කෙරුනි.

සිංහල පමනක් රාජ්‍ය භාෂාව කිරීමේ පනතත්, බෞද්ධාගම රාජ්‍යාගම බවට පත් කල 1972 ව්‍යවස්ථාවත් තුලින්, දෙමල විරෝධී වෙනස්කම් කිරීම තව දුරටත් දිවයින තුල පැලපදියම් කෙරුනේ ය. දෙමල ජනයා, ආන්ඩුවෙන් සහන බලාපොරොත්තු වූ සෑම විටෙක ම එජාපය හෝ ශ්‍රීලනිපය යන දෙකින් කුමක් විරුද්ධ පක්ෂය වුවත් ඊට එරෙහිව වාර්ගික විරෝධතාවන් ඇවිස්සූහ. ද්‍රවිඩයන් සිය අයිතීන් වෙනුවෙන් සාමකාමී විරෝධතාවන් දැක්වූ සෑම විටෙක දී ම මුහුන පෑවේ ප්‍රචන්ඩ රාජ්‍ය මර්දනයට ය. 1983 දී රාජ්‍ය අනුග්‍රහය ලත් වර්ගවාදී මැරයන්, පොලීසියේ හා මිලිටරියේ පිටුබලය ලබමින්, සිය ගනනක් ද්‍රවිඩයන් ඝාතනය කරමින් ද ඔවුන්ගේ නිවාස හා ව්‍යාපාරික ස්ථාන ගිනිබත් කරමින් ද කල වියරු ප්‍රහාරයේ දී මිලියනයක් පමන දෙනා, එක රැයකින් සරනාගතයන් බවට පත් කෙරුනාහ. සිංහල වර්ගවාදීන්ගේ එම කලු ජුලි ජන ඝාතක සංහාරය, සිවිල් යුද්ධයේ ආරම්භක වෙඩිල්ල විය.

මෙම ව්‍යසනයන් සියල්ලටත් වඩා යුද්ධය, ගම්බද හා නාගරික පීඩිතයන් තමන් වෙත දිනා ගන්නා සමාජවාදී ප්‍රතිපත්තීන් මත පදනම් වූ කම්කරු පන්තියේ බලගතු ස්වාධීන ව්‍යාපාරයක් ගොඩ නැංවීම තුලින් වලකා ගත හැකිව තිබුනි. ඊට පැවති ප්‍රධාන බාධකය වූයේ, 1940 හා 1950 ගනන්වල ජාත්‍යන්තර සමාජවාදී මූලධර්ම සඳහා සටන් වැදුනු ලංකා සමසමාජ පක්ෂය (ලසසප), වඩ වඩාත් පාලක පන්තියේ වාර්ගික දේශපාලනයට අනුගත වීම යි. 1964 දී එම පක්ෂය, සිරිමා බන්ඩාරනායකගේ ධනපති ශ්‍රීලනිප ආන්ඩුවට හවුල් වීම මගින් විවෘතව ම කම්කරු පන්තිය හා එහි ස්වාධීන ක්‍රියා මාර්ගය පාවා දුන්නේ ය.

ලසසපයෙන් කැඩී වෙන් වුන ද එහි දේශපාලනයෙන් කිසි විටෙක වෙන් නොවුනු, නව සමසමාජ පක්ෂය, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුන හා එක්සත් සමාජවාදී පක්ෂය වැනි කන්ඩායම් විසින් ද ක්‍රියාවට නැගුවේ හා නංවන්නේ පන්ති සහයෝගිතාවේ එම කාලකන්නි දේශපාලනය ම යි. ''සමාජවාදීන්'' ලෙස පෙනී සිටිමින් රැඩිකල්වාදී වැකි ඇද බාන අතර ම වෙස් පාන මෙම මධ්‍යම පන්තික කන්ඩායම්, කම්කරු පන්තිය එහි දේශපාලන ස්වාධීනත්වය තහවුරු කර ගැනීමට ගන්නා ඕනෑ ම පියවරකට ඓන්ද්‍රියව ම සතුරු ය. සෑම තීරනාත්මක දේශපාලන අර්බුදයක දී ම, මෙම අවස්ථාවාදියෝ, පාලක පැලැන්තිය සමග අත්වැල් බැඳ ගනිමින් ධනපති පාලනය රැක දීමට උදව් වෙති.

1987 ඉන්දු-ලංකා ගිවිසුමට සහයෝගය දුන් මේ කන්ඩායම්වල නායකයෝ එමගින් උතුරේ දෙමල අරගලය තලා දැමීමට ඉන්දියානු සාම සාධක හමුදාව ගෙන්වා ගැනීමටත් එකී අවසරයෙන් දකුනට ගෙන ආ ශ්‍රී ලංකා හමුදා දකුනේ ගම්බද සිංහල තරුනයන් දසදහස් ගනනක් ඝාතනය කිරීමටත් ඉඩ සැලසූහ. 1994 මැතිවරනයේ දී හා ඉන් පසුව, මෙම පක්ෂ විසින්, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ''සාම දූතිකාව'' ලෙස පාරට්ටු කල ද එම වෙස් පෑම නො වලහා ඉවත දැමූ ඇය ''සාමය සඳහා යුද්ධය'' යන ම්ලේච්ඡ සැලසුම දියත් කලා ය. 2002 වසරේ පටන් ඔවුහු, එජාපය යටතේ වේවා, ජනාධිපති කුමාරතුංග යටතේ වේවා, දැන් ජනාධිපති රාජපක්ෂ යටතේ වේවා කෙරෙන අධිරාජ්‍යවාදී ''සාම ක්‍රියාවලියේ'' උග්‍ර ආධාරකරුවන් බවට පත්ව සිටිති.

මෙම ''සාම'' පක්ෂ විසින් අලෙවි කෙරුනු හා කෙරෙන අඳබාල දේශපාලන මිථ්‍යාවන් තිබිය දී මත්, පසු ගිය හැට වසරක, විශේෂයෙන් ම අසාර්ථක වූ සාම සාකච්ඡාවල පසු ගිය සිව් වසරක, දේශපාලන ශේෂ පත්‍රය පෙන්නුම් කරන්නේ, සාමයක් හෝ දෙමල ප්‍රශ්නයට ප්‍රජාතන්ත්‍රවාදී විසඳුමක් ධනේශ්වර පාලනයේ සැකිල්ල තුල අත් කර ගත නොහැකි බව යි. යුද්ධය අවසන් කිරීම සඳහා අධිරාජ්‍යවාදී බලවතුන්ගේ පිටුබලය සහිතව ගොනු කෙරෙන විවිධ සාම සැලසුම්වලින් වුව ද සිදුව ඇත්තේ වාර්ගික ආතතීන් හා ගැටුම් උග්‍ර වීම පමනකි.

පිරිහෙන ආර්ථික තත්වය ද සමග ඒකාබද්ධ වූ මෙම වාර්ගික නරාවල මගින්, ජනගහනයේ අතිශය පසුගාමී හා පීඩිත ස්තරයන් අතර මතු කෙරෙන අපේක්ෂා භංගය ජවිපෙ හා ජාහෙඋ වැනි අන්ත ස්වෝත්තමවාදී පක්ෂ විසින් ගසා කනු ලැබේ. ගැඹුරු වන සමාජ අර්බුදයට මොන යම් ම හෝ විසඳුමක් ඉදිරිපත් කිරීම වෙනුවට ''ගෞරවාන්විත සාමයක්'' සඳහා වන ඔවුන්ගේ උද්ඝෝෂන, යථාර්ථයේ දී කැඳවුම් කරන්නේ එල්ටීටීඊය තලා දැමීම හා යුද්ධයට යලි අවතීර්න වීමකි. මෙම පක්ෂ දෙමල ජනතාවට පමනක් නො ව සමස්තයක් ලෙස කම්කරු පන්තියට ම බරපතල තර්ජනයක් එල්ල කරයි.

## සමාජවාදී විකල්පය

දිවයිනට තර්ජනයක්ව ඇති ව්‍යසනය වැලැක්විය යුතු ය, වැලැක්විය හැකි ය. යුද්ධය අවසන් කිරීම හා සියලු ජන වර්ගයන්ට අවශ්‍ය සුසංගත සමාජ කොන්දේසි ගොඩ නැංවීම සඳහා, යුද්ධයට ද වර්ගවාදයට ද මෙන් ම සමාජ අසමානතාවට ද වගකිව යුතු ලාභ පද්ධතිය අහෝසි කිරීම අවශ්‍ය වේ. සාම අරමුන සාක්ෂාත් කිරීමේ දේශපාලන නායකත්වය ගැනීම පිනිස කම්කරු පන්තිය සඳහා ක්‍රියා මාර්ගයක් සසපය විසින් ඉදිරිපත් කෙරෙයි.

උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ශ්‍රී ලංකා හමුදාවන් වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කිරීම සඳහා උද්ඝෝෂනයකට මූලිකත්වය ගැනීම පිනිස, අපි, කම්කරු පන්තියට කැඳවුම් කරන්නෙමු. මෙම ප්‍රදේශයන්හි සිටින දසදහස් සංඛ්‍යාත හමුදා හා පොලිස් භටයන් ආක්‍රමනික හමුදාවක් ලෙස ක්‍රියාත්මක වන අතර එමගින් ක්‍රමානුකූලව සිදු කරන ප්‍රචන්ඩ ක්‍රියා, හිතුවක්කාරී අත් අඩංගුවට ගැනීම්, වධබන්ධන හා ඝාතන, දෙමල ජනගහනයේ පිළිකුලට හා වෛරයට පාත්‍රව පවතී. මෙම පීඩාවන් අවසන් කිරීම සඳහා එල්ල කෙරෙන ඉල්ලීම යුද්ධය නිමා කිරීම සඳහා වන පූර්ව කොන්දේසියක් වන අතර සාමය හා මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරන සියල්ලන් ආකර්ෂනය කර ගන්නා වූ ස්තම්භයක් වනු ඇත.

භීතිය හා සන්ත්‍රාසය ඇවිස්සීමට කැප වූ සිංහල ස්වෝත්තමවාදියෝ, ''හමුදාව ආපසු කැඳවීමේ අර්ථය වනු ඇත්තේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ ජයග්‍රහනයත්, බෙදුනු ජාතියක් හා වෙන ම ඊලමක්'' යැ යි බෙරිහන් දෙති. සසපයේ අපි මෙසේ පිලිතුරු දෙමු. "ඇත්ත නම් ඒ කතාවේ ප්‍රතිවිරුද්ධය යි. දෙජාතියේ ම පාලක පැලැන්තියට එරෙහිව සිංහල හා දෙමල වැඩ කරන ජනතාව ඒකාබද්ධ අරගලයක පිහිටුවීම සඳහා එක ම පදනම මෙය යි. මෘග බලය යෙදීම මගින් කෘත්‍රිම ලෙස ඒකාබද්ධ කර ඇති ශ්‍රී ලංකාවේ ධනපති රාජ්‍යයට අපි සහාය නොදෙන්නෙමු. අප සටන් වදින්නේ කම්කරු පන්ති එකමුතුවේ පදනම මත, ශ්‍රී ලංකා හා ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා යි.''

දෙමල මහජනතාවගේ නො ව දෙමල ධනේශ්වරයේ අවශ්‍යතාවන් නියෝජනය කරන එල්ටීටීඊය සඳහා දොර විවෘතව ඇත්තේ, කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක් නොමැති වීම නිසා ය. උතුරු-නැගෙනහිර වෙන ම ධනපති රාජ්‍ය කැබලිත්තක් සඳහා වන එහි ඉල්ලීම, දෙමල කම්කරු පන්තියට දේශපාලන මර උගුලකි. උතුරු-නැගෙනහිර මිලිටරි යටත් කිරීම අවසන් කිරීමේ දේශපාලන ව්‍යාපාරයක් දිවයින පුරා මතු වී ඒම තරම් අන් කිසිවක් මගින්, එල්ටීටීඊයේ මැර ක්‍රියා හා සූරා කෑමට එරෙහි වන දෙමල කම්කරුවන්ගේ හා ගොවීන්ගේ අරගලය ශක්තිමත් නොකරනු ඇත.

2004 දෙසැම්බරයේ සුනාමි ව්‍යසනයේ දී සිංහල, දෙමල හා මුස්ලිම් සාමාන්‍ය වැඩ කරන ජනතාව, තමන් අතර නිරතුරුව ප්‍රචලිත කෙරෙන ජඩ වාර්ගික දේශපාලනය පසෙකට පිස දා හැර, ස්වයංසිද්ධව ම එකිනෙකාගේ උදව්වට එක්රැස් වූහ. හදිසි නීතිය පනවා, ජනාධිපති කුමාරතුංග, ඇගේ ආන්ඩුවේ හිඟෝටු සහන කටයුතු හමුදාවේ භාරයට පත් කලේ ප්‍රධාන කොට ම මේ හේතුව නිසා ය. වැඩ කරන ජනතාවගේ ඒකාබද්ධ ව්‍යාපාරයක් කෙරෙහි පාලක පැලැන්තිය දක්වන්නේ භීතියකි. ඉහත කී අත්දැකීමෙන් කලලරූපීව ප්‍රකාශයට පත් වූයේ, සියල්ලන්ගේ ප්‍රජාතාන්ත්‍රිය හා සමාජ අයිතීන් සඳහා කම්කරු පන්තියේ පොදු අරගලයකට පවතින ප්‍රබල විභවය යි.

දිගු කලක් තිස්සේ ඔද්දල් වෙමින් තිබෙන සියලු ආකාරයේ පීඩාවන් අවසන් කිරීමට ද ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් පිලිබඳ ප්‍රශ්න විසඳීමට ද නව ව්‍යවස්ථාවක් අවශ්‍ය බව සසපය අවධාරනය කරයි. එහෙත් ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම ම කල යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස යි. 1972 දී හා 1978 දී, එවකට පැවති පාර්ලිමේන්තු වංචනික ලෙස ව්‍යවස්ථාදායක සභා බවට පත් කල ආකාරයට නො ව ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ නිශ්චිත කාරනය සඳහා ම වැඩ කරන ජනතාව විසින් ප්‍රජාතන්ත්‍රවාදීව පත් කර ගත් අව්‍යාජ ව්‍යවස්ථාසම්පාදක මන්ඩලයක් මගින් නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කර සම්මත කර ගත යුතු ය.

අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය වනාහි, සෑම විට ම පොහොසත් හා වරප්‍රසාදිත කොටස්වලට වාසිදායක ලෙස සැකසුනු, ධනපති පාර්ලිමේන්තු මැතිවරන හා නීති පද්ධතියෙන් පිලිගැනෙන ආකාරගත සමානතාවට වැඩි දෙයකි. සමාජයේ ආර්ථික අත්තිවාරම, පුලුල් වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා වන පරිවර්තනයකට භාජන කල යුතු ය. ධනවතුන් අතලොස්සකගේ ලාභය සඳහා නො ව සමාජයේ අතිමහත් බහුතරයකගේ උවමනාකම් ඉටු කෙරෙන පරිදි සියලු ප්‍රධාන මූල්‍ය, කාර්මික හා වානිජ්‍ය ව්‍යවසායන් ප්‍රජාතන්ත්‍රවාදී පොදු අයිතියට හා පාලනයට යටත් කිරීමේ සමාජවාදී ක්‍රියා මාර්ගයක් සසපය විසින් ඉදිරිපත් කෙරෙන්නේ එබැවින් ය.

ඉන්දියාවේ දකුනු කෙලවරේ තනි, කුඩා දිවයිනක් තුල, සමාජවාදය සාක්ෂාත් කල නොහැකි ය. සැබවින් ම ගත් කල, ලොකු හෝ කුඩා හුදෙකලා ජාතියක් තුල ද එය ඉටු කර ගනු නොහැකි ය. සමාජවාදය සඳහා අරගලය අවශ්‍යයෙන් ම ජාත්‍යන්තර ය. ගෝලීය ධනවාදයේ කොල්ලකාරිත්වයට ඇති එක ම විකල්පය වන්නේ සමාජවාදී පිලිවෙත් මත සමාජය

ප්‍රතිසංවිධානය කිරීම සඳහා කම්කරු පන්තියේ ජාත්‍යන්තර වසයෙන් ඒකාබද්ධ කෙරුනු ප්‍රතිප්‍රහාරයකි. ශ්‍රී ලංකා හා ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලය වූ කලි දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ද සමාජවාදී එක්සත් ජනපදයක් ගොඩ නැගීමේ පුලුල් අරගලයක කොටසකි. හතර වැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සියලු ම ශාඛාවන් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ)* උපයෝගී කර ගනිමින් සටන් වදින්නේ මෙම ක්‍රියා මාර්ගය සඳහා යි.

1968 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ලෙස පිහිටුවුනු සසපය ලංකාව තුල හතර වැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාව යි. කම්කරු පන්තියේ හා පීඩිත ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය හා සමාජ අයිතීන් සඳහා එය අඛන්ඩව පෙනී සිට තිබේ. සාමය අගය කරන්නා වූ ද ප්‍රජාතාන්ත්‍රිය හා සමාජ අයිතීන්ට කෙරෙන පහර දීම්වලට විරුද්ධ වන්නා වූ ද සියල්ලන්ට අප කියා සිටින්නේ, *ලෝසවෙඅ* කියවන ලෙසත්, සසපය හා හතර වැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩ නැගීමට එක් වන ලෙසත් ය.

© www.wsws.org